# ජුලී ජේ. චංග් තානාපතිතුමිය විසින්

## Uber ශ්‍රී ලංකා විදුලි පාපැදි සංචිතය දියත්කළ අවස්ථාවේ පලකළ අදහස්

## 2023 මාර්තු 16 වැනිදා, බ්‍රහස්පතින්දා ප.ව.6:00-ප.ව. 8:00

## මොනාර්ක් ඉම්පීරියල්, ශ්‍රී ජයවර්ධනපුර

විජේසේකර අමාත්‍යතුමන්, Uber කලාපීය අධ්‍යක්ෂ ඕර්ගිල් මහතා, AmCham අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, සහ මිත්‍රවරුනි. සුභ සන්ධ්‍යාවක් වේවා. එක්සත් ජනපදයේ මා පදිංචි ප්‍රාන්තය වන කැලිෆෝනියා ප්‍රාන්තයේ විශිෂ්ට ඇමෙරිකානු සමාගමක් වන Uber සමාගම ශ්‍රී ලංකාවේ විදුලි වාහන සඳහා කරන ආයෝජනය ආරම්භ කරන මේ සන්ධ්‍යාවේ ඔබ සමගින් එක්වන්නට ලැබීම ගැන මා උද්යෝගයෙන් පසුවනවා. එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් අතරේ ද්වීපාර්ශවීය සබඳතාවල 75 වැනි වර්ෂය සමරන මේ වසරේ දී දියත් කෙරෙන මේ Uber විදුලි වාහන (EV) මුලපිරීම, අපගේ මේ සබඳතාවය ජනතාව, ප්‍රගතිය සහ හවුල්කාරීත්වය මත පදනම් වී ඇති ආකාරය සඳහා හොඳම උදාහරණයක් වනවා.

මේ තත්වයට ළඟාවීම සඳහා ශ්‍රී ලාංකික රජය දැරූ වෙහෙස මහන්සිය අගය කරන්නට මා මුළින්ම කැමතියි. මෙරට ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීම සඳහා අවශ්‍ය කරන මූලික පදනම සලසමින්, ප්‍රධාන ද්වීපාර්ශවීය ණයකරුවන් සියළුදෙනා වෙතින් ප්‍රමාණවත් මූල්‍යකරණ සහතික ලැබී ඇති බව ගිය සතියේ IMF විසින් නිවේදනය කරනු දැකීමෙන් අප සතුටු වූවා. ලබන සතිය තරම් මෑතකදී ම ශ්‍රී ලංකාව සඳහා දීර්ඝ කාලීන අරමුදල් පහසුකමක් (Extended Funding Facility)  සඳහා IMF මණ්ඩලයෙන් අනුමැතිය ලැබීමට ඉඩ තිබෙනවා. ඉදිරියට කරන්නට වැඩ රාශියක් ඇතිමුත්, ඒ සියල්ල සාර්ථක වුවහොත්, IMF පැකේජය සමගින් අනෙකුත් ණයකරුවන්ගෙන් ද මූල්‍යකරණය සහ වඩාත් වැඩියෙන් ආයෝජන ද යොමුකරගැනීමට හැකිවී, එතුළින් වඩාත් ශක්තිමත්, තිරසාර සහ සර්වග්‍රාහී



SENSITIVE BUT UNCLASSIFIED

ආර්ථික වර්ධනයක් සාක්ෂාත් කරගන්නට ශ්‍රී ලංකාවට හැකි වේවි. එය ඉතා හොඳ ප්‍රවෘත්තියක්.

දැනට වසරකටත් අඩු කාලයකට පෙර, දින ගණන් පැවති ඉන්ධන පෝලිම් මාර්ගය අවහිර කරන තත්වයක් පවතිද්දී මේ තත්වයේ කෙළවරක් දකින්නට හැකි දිනක් ගැන සිතීමත් දුෂ්කර වූවා. වඩාත් හොඳ බලශක්ති සුරක්ෂිතතාවයක් ඇති කිරීම සඳහා, දුෂ්කර එහෙත් කළයුතු ප්‍රතිසංස්කරණ සිදුකිරීම සඳහා බලශක්ති අමාත්‍යවරයා විසින් උත්සාහයෙන් සහ කැපවීමෙන් කටයුතු කිරීමත්, මේ අභියෝගවලට අනුව හැඩගැසීම සඳහා කළ ඉල්ලීමට Uber වැනි සමාගම් දැක්වූ ප්‍රතිචාරයත් මා අගය කරනවා.

එක්සත් ජනපද සමාගම් කරන ආයෝජනවලින් ශ්‍රී ලංකා ආර්ථිකය බොහෝ ඵල නෙලාගන්නවා. 70කට අධික රටවල් සංඛ්‍යාවක ක්‍රියාත්මක වන Uber සමාගම, නවෝත්පාදනය සහ තිරසාරත්වය සම්බන්ධයෙන් ඉදිරියෙන්ම සිටින සමාගමක් වනවා. අප හැමදෙනාගේම ගමනාගමනය වඩාත් හොඳින් කළ හැක්කේ කෙසේදැයි ඔවුන් නිරන්තරයෙන් සිතාබලන බව Uber හි මෙහෙවර ප්‍රකාශයේ සඳහන් වනවා. 2040 වනවිට කාබන් මධ්‍යස්ථ තත්වයට යන්නට ඔවුන් කැපවී සිටිනවා. Uber විසින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට රුපියල් බිලියන 81ක දායකත්වයක් ලබා දී තිබෙනවා, කෝවිඩ් වසංගත සමයේ සෞඛ්‍ය සේවකයින්ට පුද්ගලාරක්ෂක උපකරණ සහ ප්‍රවාහන පහසුකම් සලසා දී තිබෙනවා, ශ්‍රී ලංකා රතුකුරුස සංවිධානය සමගින් එක්ව ආහාර සහ ඖෂධ ප්‍රවාහනය සඳහා ඩොලර් 200,000ක් පරිත්‍යාග කර තිබෙනවා, එමෙන්ම, තරුණ කටයුතු අමාත්‍යාංශය සමගින් ව්‍යවසායකත්ව අභියෝගයක් සඳහා සත්කාරකත්වය දැරීම ඇතුළුව තවත් මුලපිරීම් ද සිදුකර තිබෙනවා.

විදුලි වාහන සඳහා සහ කාන්තාවන්ගේ ආර්ථික සවිබලගැන්වීම සඳහා ආයෝජන කිරීම ආර්ථිකය වඩවඩාත් වර්ධනය කරගැනීම සඳහා ඉතාමත් වැදගත් යැයි මා තදින්ම විශ්වාස කරනවා. ලොව සෑම තැනකම එය එසේ වන අතර විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට එය අදාළ වනවා. ශ්‍රී ලංකාවේ බලශක්ති අංශය තිරසාර සහ විශ්වසනීය, වෙළඳපල මගින් මෙහෙයවෙන අංශයක් බවට පත් කරගැනීම සඳහා සහයදීමට ඇ. ඩොලර් මිලියන 19ක USAID ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන අප විසින් දියත් කළේ

මිනිසායි.විජේසේකර අමාත්‍යතුමනි, මේ වැඩසටහන සඳහා ඔබේ සහය සහ සහයෝගීතාවය ඉතා වැදගත් වූවා.

මෙවැනි ආයෝජනවල ආර්ථික ප්‍රතිලාභ ඉතාමත් වැදගත් වනවා. ප්‍රධාන වශයෙන්ම ඒ හරහා නව රැකියා නිර්මාණය වන අතර ආර්ථික වර්ධනය දිරිගැන්වෙනවා. ඉදිරි වර්ෂවලදී ගෝලීය විදුලි වාහන වෙළඳපල ශීඝ්‍රයෙන් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2030 වනවිට ගෝලීය වශයෙන් අළෙවි කෙරෙන සියළුම වාහනවලින් සියයට 30ක් විදුලි වාහන වීමට ඉඩ ඇතැයි කියනවා. එනම්, මේ වෙළඳපලට සහභාගිවීමට සහ එම ක්‍රියාවලිය තුළ නව රැකියා උත්පාදනය කරගැනීමට ශ්‍රී ලංකාවට සැලකියයුතු අවස්ථා තිබේවි.

ඊට අමතරව, විදුලි වාහන සඳහා ආයෝජන කිරීම තුළින් ශ්‍රී ලංකාවට සෑහෙන වියදමක් ඉතිරි කරගැනීමට හැකි වනවා. විදුලි වාහන, සාම්ප්‍රදායික ගැසොලීන් හෝ ඩීසල් බලයෙන් දුවන වාහනවලට වඩා අඩුවෙන් මෙහෙයවන්නටත් නඩත්තු කරන්නටත් හැකියි. එනම්, ශ්‍රී ලංකාවේ ආනයන වියදම අඩු කරගැනීමට සහ ප්‍රමුඛතාවය දියයුතු අනෙකුත් අංශවලට යෙදවීම සඳහා සම්පත් නිදහස් කරගැනීමට එය උපකාරි වනවා.

ආර්ථිකය වර්ධනය කරගැනීමට පමණක් නොවේ, පරිසරය සඳහා ද විදුලි වාහන ඉතාමත් හිතකරයි. දැනට ශ්‍රී ලංකාව වායු දූෂණය සහ රථවාහන තදබදය සම්බන්ධයෙන් විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවල අභියෝගවලට මුහුණ දී සිටිනවා. මේ අභියෝග සඳහා පවිත්‍ර සහ තිරසාර විසඳුම් විදුලි වාහන හරහා ලබාදෙනවා. USAID හි ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන යටතේ ලබාදෙන ප්‍රදානයක් හරහා කොළඹ නගරයේ මහජන භාවිතය සඳහා ඊ-පාපැදි සහ ඊ-ත්‍රිරෝද රථ ආරෝපණය කරන ස්ථාන (charging station) තැනීම සඳහා අප සහය දෙනවා. ශ්‍රී ලංකාවේ විදුලි වාහන වෙළඳපල වඩාත් ව්‍යාප්ත කිරීම සඳහා, පහසුවෙන් ප්‍රවේශවිය හැකි ආරෝපණ යටිතල පහසුකම් තිබීම මූලික පදනමක් වනවා. Uber සහ එහි හවුල්කරුවන් සමගින් මේ ආරම්භක වෑයම සම්බන්ධයෙන් සමීපයෙන් වැඩ කරන්නට අප උද්යෝගයෙන් සිටිනවා.

ආරෝපණ මධ්‍යස්ථාන සඳහා සුරක්ෂිතතා ප්‍රමිති සහ පරිහරණ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා ද USAID ප්‍රධාන රජයේ ආයතන සහ එම ක්ෂේත්‍රයේ පරදු දරන්නන් සමගින් වැඩ කරමින් සිටිනවා. ඒ හරහා, රට පුරා විදුලි වාහ ආරෝපණ මධ්‍යස්ථානවල සුරක්ෂිතතාවය සහ විශ්වසනීයත්වය සහතික කරගත හැකියි.

ශ්‍රී ලංකාව නැවතත් යථා තත්වයට පත්වීම සඳහා කාන්තාවන් සවිබල ගැන්වීම වැදගත් වන බව මා සඳහන් කළා. ශ්‍රී ලංකාව සමගින් අපේ ඇති හවුල්කාරීත්වය තුළ එය එක්සත් ජනපදය ප්‍රමුඛතාවයක් වශයෙන් සලකනවා, විශේෂයෙන්ම, මේ මාසයේ, එනම් කාන්තා ඉතිහාස මාසයේ පමණක් නොව වසර මුළුල්ලේ ම මේ පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් වනවා. ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ට සමාන අවස්ථා සහතික කරදීම සමාජ යුක්තිය සම්බන්ධ කාරණාවක් පමණක් නොවේ, එය ආර්ථිකමය කාරණාවක් වනවා. ශ්‍රී ලංකාවේ Uber විධායක නිලධාරිනියන් වශයෙන් තන්ෂිකා සහ අනීරා නායකත්වය ගෙන කටයුතු කිරීම ඉතා විශිෂ්ටයි!

එ.ජ. ජාත්‍යන්තර සංවර්ධන මූල්‍ය සංස්ථාව, එනම් DFC හරහා අප ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ ආයෝජනය කර තිබෙනවා. එහිදී අප කාන්තාවන්ට හිමි කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යාපාර කෙරෙහි අවධානය යොමුකර තිබෙනවා. එමෙන්ම අප කාන්තා සහ තරුණ ව්‍යවසායකයින් වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට සහය ලබා දෙනවා.

අවසාන වශයෙන්, මා යළිත් වරක් Uber වෙත ස්තූතිය පිරිනමන්නට කැමතියි. එක්සත් ජනපදයෙන් කෙරෙන ආයෝජනයක් හරහා සැලකිය යුතු ආර්ථික ප්‍රතිලාභ ගෙන දෙන්නටත් ශ්‍රී ලාංකික ජනතාව වෙත වඩාත් දීප්තිමත් අනාගතයක් පිළිබඳ බලාපොරොත්තු දල්වන්නටත් හැකි ආකාරය පෙන්වා දීම පිළිබඳව ස්තූතියි. නව රැකියා අවස්ථා, ආනයන වියදම අඩුකරගැනීම, සහ වඩාත් සර්වග්‍රාහී හා තිරසාර ආර්ථික වර්ධනය සමගින් Uber පිළිබිඹු කරන්නේ ජනතාව, ප්‍රගතිය සහ හවුල්කාරීත්වය සම්බන්ධයෙන් අප කථා කරද්දී අදහස් කරන දෙයමයි. ඔබේ අළුත්ම ඊ-පාපැදියක මට ගෙදර යෑමට අවස්ථාවක් ලබාගන්නටත් ඔබට උදවු කළ හැකියි. බොහෝම ස්තූතියි.



SENSITIVE BUT UNCLASSIFIED